# එජාප හා රනිල් කොයිබට ද?

රනිල් වික්‍රමසිංහ මහතා පසුගිය දා ජනමාධ්‍යවේදීන් විවේචනය කෙළේ ය. ජනමාධ්‍යවේදීහු අනෙක් අයට වඩා උසස් තලයක ඇත්තෝ නො වෙති. ඔවුහු ද පෘථග්ජනයෝ වෙති. ඔවුහු ද දේශපාලනඥයන් මෙන් ම ජනතාවට සමීප වූවෝ වෙති. එමෙන් ම ඔවුහු ද ජනමතය සකස්කිරීමේ දී යම් කාර්යභාරයක් ඉටුකරති. ඔවුහු ද ජනතාවට වගකිවයුත්තෝ වෙති. එබැවින් ඔවුන් ජනතාව නොමඟ නොයැවිය යුතු ය. ඔවුහු ද ජනතාවට උඩින් සිටින පිරිසක් නො වෙති. දේශපාලනඥයන් මෙන් ම ජනමාධ්‍යවේදීන් ද විවේචනයට ලක්කළ යුතු ය. එබැවින් රනිල් වික්‍රමසිංහ මහතාට ජනමාධ්‍යවේදින් විවේචනය කිරීමට අයිතියක් ඇත. එහෙත් ඒ මහතා ඒ අයිතිය යොදාගත යුත්තේ ද ජනතාවගේ පැත්තේ සිට ජනතාවට යහපතක් වන අයුරින් කටයුතුකිරීම සඳහා ය. මෙහි දී අනිවාර්යයෙන් ම ජනතාව යනු කවුද යන ප්‍රශ්නය පැන නගී. රට බෙදීමට තැත්කරන රජයට විරුද්ධ ව ආයුධ ගෙන ඇති ප්‍රභාකරන් ඇතුළු ත්‍රස්තවාදීන් ජනතාව ලෙස සලකා ඔවුන්ට යහපතක් වන අයුරින් ජනමාධ්‍යවේදීන් විවේචනය කිරීමට ද හැකිකමක් වෙයි. රාජ්‍ය නොවන සංවිධානවල බැලයන්ට ද ත්‍රස්තවාදීන් ජනතාව වෙයි. ජනතාව යනු ද අනෙක් වචන හා සංකල්ප මෙන් ම සාපේක්ෂ වෙයි.

රනිල් වික්‍රමසිංහ මහතා හා එජාපක්ෂය ජනතාව යැයි කියන්නේ කාහට ද? ඉතා පැහැදිලිව සිංහලයන්ගෙන් අති විශාල බහුතරයක් විකුමසිංහ මහතාට හා එජාපක්ෂයට ජනතාව නො වෙයි. අද සිංහලයන්ගේ මතය නිරූපණය වන්නේ දිවයින පුවත්පතෙනි. විශේෂයෙන් ම දිවයින ඉරිදා සංග්‍රහයෙනි. රනිල් වික්‍රමසිංහ මහතා දිවයින ඉරිදා සංග්‍රහයට හා එහි කර්තෘ ගාමිණී සුමනසේකර මහතාට ජාතිවාදී යනුවෙන් චෝදනා කර ඇත. මේ චෝදනාව මේ ආකාරයෙන් එල්ල කළ පළමු තැනැත්තා වික්‍රමසිංහ මහතා නො වේ. දිවයිනට ජාතිවාදී යැයි කී අය බොහෝ වෙති. තමන්ගේ ප්‍රබුද්ධ බව පෙන්වීමට ද ඇතැම්හු ඒ චෝදනාව කළහ. අද සිංහල ජාතියේ වීරයන් බවට පත්වීමට කැසකවන එතරම් බලහතු නොවන එහෙත් 1916-17 දී අනාගත ජනාධිපතිවරුන් වීමට සිහින මවන පුද්ගලයෝ ද කලකට පෙර දිවයිනට ජාතිවාදී හංවඩුව ගැසූහ. එබැවින් රනිල් වික්‍රමසිංහ මහතා ද ඔවුන් අනුව ගොස් අනාගයේ දී දේශ හිතෛෂියකු ජාතියේ උරුමකරුවකු වීමට බැරි නැත.

ඒ කෙසේ වෙතත් අද රනිල් වික්‍රමසිංහ මහතා ඉන්නේ විජාතික බලවේග සමග ය. ඔහු අද විජාතික බලවේගවල ප්‍රධාන ප්‍රකාශකයා වෙයි. ප්‍රභාකරන් ඒ බලවේගවල සටන් මෙහෙයවන්නා වෙයි. රනිල් ප්‍රභාකරන් සිටින්නේ එකම බෝට්ටුවේ ය. ඔවුන් කන්නේ එකම පතෙහි ය. රනිල් වික්‍රමසිංහ මහතා දිවයින හා ගාමිණී සුමනසේකර මහතා ජාතිවාදී නොවේ යැයි කීවේ නම් පමණක් අපි පුදුමයට පත්වෙමු. දිවයින පුවත්පත, සිංහල ජාතිවාදය ගැන කතාකරන පඬියන් ද එහි සේවය කරද්දී ද, සිංහල ජනමතය නියෝජනය කරන බව සැබෑ ය. එහෙත් එහි සෑම මතයකට ම ඉඩ වෙන් විය. අද ද එසේ ඉඩ වෙන්වන බව අපි දනිමු. දැනට ටික කලකට පෙර එක් ප්‍රබුද්ධ සිනමාකරුවෙක් තම සිංහල විරෝධී චිත්‍රපටියක් ගැන ලිවී ය. අප ඔහුට ලියූ පිළිතුර දිවයින ඉරිදා සංග්‍රහයෙහි පළ නො විණි. සිංහල විරෝධී කසිකබල් ප්‍රබුද්ධයන් දැන් එතරම් දිවයිනට නොලියන බැවින් සමහරවිට සුමනසේකර මහතා ඒ කසිකබල් ප්‍රබුද්ධයා වැන්නන් ලවා තව තවත් ලියවීමට එසේ කළා විය හැකි ය.

දිවයින පුවත්පතෙහි අද සිංහල විරෝධී ලිපි පළ නොවන්නේ නම් එයට ඇත්තේ එක් ප්‍රධාන හේතුවකි. ඒ සිංහල විරෝධී ලේඛකයන් විවාදවලින් පැරදී දිවයින පුවත්පතෙන් පළා යෑම ය. අවුරුදු විස්සකට පමණ පෙර දිවයිනෙහි විවාද නොකළ මාතෘකාවක් නැති තරම් ය. ජාතික චින්තනය, ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය, බටහිර විද්‍යාව, දර්ශනය, යථාර්ථය, මාක්ස්වාදය, පරිසරය, ආයුර්වේදය, සිංහල වෙදකම, සාහිත්‍යය, සිංහල සංගීතය, ගොවිකම, කෙම් ක්‍රම, වැව් තාක්ෂණය ආදී විවිධ දෑ එහි සාකච්ඡාවට බඳුන් විය. දිවයින පුවත්පත ආරම්භයෙහි සිට ම මේ සාකච්ඡාවලට මම ද සහභාගි වීමි. අද දිවයිනෙහි ප්‍රධානීන් බවට පත්ව සිටින ඇතැමුනට එහි ඉතිහාසය ගැන අවබෝධයක් නැත. දිවයින නොවන්නට ජාතික චින්තන මතවාදයක් නැත යන්න අතිශයෝක්තියක් නො වේ. එහි දී කාලය සඟරාව ද වැදගත් කාර්යභාරයක් ඉටුකෙළේ ය. ජාතික චින්තනය යන්න අපට ඉංගිරිසි වචන දෙකක (නැෂනල් තෝට්) සිංහල පරිවර්තනයවත් ෆ්‍රොම් වැන්නකුගේ සෝෂල් කැරැක්ටර් වැනි සංකල්පයක සමාජ විඥානය වැනි බහුබූත පරිවර්තනයක්වත් නො වී ය. චින්තනය යන වචනය අප යොදා ගත්තේ වඩා ගැඹුරු ආකාරයකිනි. යුදෙව් සෙමිටික්

© Prof. Nalin De Silva

ආදී වචන භාවිතා වී තිබුණ ද යුදෙව් චින්තනය යන වචනය පළමුව යොදා ගැනුණේ අප අතිනි. චින්තනය යන වචනය යොදා ගැනුණේ තෝට් යන වචනයක පරිවර්තනයක් ලෙස නොව සුසමාදර්ශය යන සංකල්පයෙන් කියැවෙන්නට ද වඩා ගැඹුරු අරුතකිනි. එහෙත් ඒ සුසමාදර්ශය යන්න සාධාරණීකරණයෙන් තනා ගැනුණක් ද නො වී ය. චින්තනය හා එහි ප්‍රභේද වූ යුදෙව් චින්තනය, ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය, සිංහල බෞද්ධ චින්තනය ආදිය අවුල් අදහස් ගෙන දෙන වචන නොව පැහැදිලි අරුත් සහිත සංකල්ප විය. චින්තනය යන සංකල්පය 1986 ට පෙර නිර්මාණය කෙරුණ ද ඒ ඔපමට්ටම් වූයේ දිවයින ඔස්සේ පවත්වනලද විවාද මගින් ය.

මාක්ස්වාදයට, යථාර්ථයට හා බටහිර විද්‍යාවට ඉතා දැඩි ලෙස පහර නොගසා ගොඩනැගිය හැකි ජාතික ප්‍රවාදයක් නැත. කන බොන දෑ ඇති බැවින් යථාර්ථයක් ඇතැයි සිතන්නන්ගේ ගැඹුරු තබා කිසිම දර්ශනයක් නැති වුවත් ඔවුන් සිටියදීත් අපි ඉහත සඳහන් ත්‍රිත්වයට හා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට දැඩිව පහර දුන්නෙමු. ඉන් සිංහල බෞද්ධ විරෝධීන් ඇඹරී දිවයිනෙන් පළා යද්දී දර්ශනයක් නැතිව ජාතික චින්තනයේ දාර්ශනික පසුබිම මාක්ස්වාදය විය යුතු යැයි කී ඊනියා යථාර්ථවාදීනට ද ඒ ඉවසීමට සිදුවිය. සිංහල ජාතිකත්වයේ (සිංහලත්වයේ) මතවාද දිවයින අයිලන්ඩ් විදුසර ඔස්සේ එසේ ගොඩනැගෙද්දී පීටර් ෂෝක් ඉදිරියට ගොස් අනේ අප නම් සිංහලත්වයක් ගැන කතාකර නැතැයි කිවුවෝ අද දර්ශනයක් නැත්තන් දාර්ශනිකයන් ලෙස ඔසවා තබති. ඔවුහු අප උපාලි පුවත්පත් සමාගමේ දිවයින ද ඇතුළු පුවත්පත්වලට ලියූ ලිපි තුන්දහසක් පමණ හැන වචනයක්වත් සඳහන් නොකිරීමට වග බලා ගනිති. එහෙත් දිවයිනෙන් වූ සේවයට කදිම උදාහරණක් වෙයි. ආයුර්වේදයට විරුද්ධව ලියූ බටහිර වෛද්‍ය මහාචාර්යවරයෙක් අද ආයුර්වේදය පිළිබඳ සම්මන්ත්‍රණවල දී මුඛ්‍ය දේශනය පවත්වයි. එහෙත් දිවයිනේ ආයුර්වේදය හා පරිසරය ගැන ජාතික මතවාද ගොඩනැගුවන් ආයුර්වේදයටත් පරිසරයටත් අමතක වී ඇත. ජාතික මතවාදය, ප්‍රභාකරන් පැරදවිය හැකි බව පැරදවිය යුතු බව ආදී මත පළමු වරට ජනතාවට ගෙන ගියේ යැයි උදම් අනන දේශපාලන පක්ෂවලට තමන් ගෙන ගියේ යැයි කියන මතවාදය දිවයින ඔස්සේ ගොඩනැගී ඒ වනවිටත් ජනතාව අතර තිබූ එකක් බව අමතක වී ඇත; අඩු තරමින් ජනතාව අතරට ගෙන යෑමට මතවාදයක් තිබිය යුතු බව අමතක ය.

එහෙත් රනිල් වික්‍රමසිංහ මහතා මොන දුර්වලකම් තිබුණත් අතීතය අමතක නො කරයි. ඒ මහතාට අනුව දිවයින හා එහි කර්තෘ ගාමිණී සුමනසේකර මහතා ජාතිවාදී ය. වික්‍රමසිංහ මහතා ජාතික මතවාදය ජාතිවාදී ලෙස හඳුනාගනියි. ඒ මගතාට හා එජාපක්ෂයට සැමදාමත් තිබි ප්‍රශ්නය සිංහල මතවාද ජාතිවාදී ලෙස පෙනී යැම ය. ඒ එජාපක්ෂයේ නායකත්වය ද ජනතාව ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ පුද්ගලයන් වීම නිසා ය. ඒ ජනතාව සංස්කෘතික වශයෙන් ගත්කල රනිල් වික්‍රමසිංහ මහතා මෙන් ම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අයත් වෙති. මෙයින් කියැවෙන්නේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අයත් සියළු දෙනා එජාපක්ෂයට අයත් බව හෝ එජාපක්ෂයට ඡන්දය දෙන සියළු දෙනා යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අයත් බව හෝ නො වේ. මාක්ස්වාදීහු ද යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අයත් වෙති. එජාපක්ෂය 1954ට පමණ පෙර මෙරට ජනතාවට පෙනුණේ නිදහස දිනාගත් ජාතික පක්ෂය ලෙස ය. එෆ් ආර් සේනානායක මහතා ඒ පක්ෂයේ නොවූව ද ඒ සම්ප්‍රදාය එජාපක්ෂයේ සම්ප්‍රදාය ලෙස ජනතාවට පෙනිණි. ඩී එස් සේනානායක මහතා ජාතියේ පියා ලෙස අභිෂේක කෙරිණි. 1935 දී පිහිටුවන ලද සමසමාජ පක්ෂය හා පසුව 1943 දී පිහිටුවනු ලැබූ කොමියුනිස්ට් පක්ෂය සිංහල ජනතාවට කිසිදා ජාතිකත්වයේ පක්ෂ නො වී ය. ඒ එක්කෝ ඊනියා ජාත්‍යන්තර පක්ෂ විය. නැත්නම් විජාතික පක්ෂ විය. එහි වාසිය ද එජාපක්ෂයට ම හිමි විය. 1951 දී පිහිටුවනු ලැබූ ශ්‍රී ල නි පක්ෂය මුල්දී තවත් ලිබරල් පක්ෂයක් විය. එහි සිංහල ජනතාවට එතරම් ආකර්ෂණයක් නො වී ය. එහෙත් 1954 දී පමණ ඒ පක්ෂය සිංහලත්වයේ පක්ෂය බවට පත්විය. ටික කලක් විජාතික බලවේග විසින් ඒ පක්ෂයේ නායකත්වය චන්ද්‍රිකා කුමාරතුංග ඔස්සේ ඩැහැගනු ලැබුව ද මහින්ද රාජපක්ෂ මහතා යටතේ පක්ෂය නැවතත් නියම මගට වැටී ඇත. එහෙත් එජාපක්ෂයට ඡන්දය දෙන පිරිසක් සිංහලයන් අතර වෙති. මේ පිරිස එකල ඒ පක්ෂය ජාතික පක්ෂයක් ලෙස හඳුනාගත් අයගෙන් පැවතෙන්නෝ ය. මේ පිරිස නොවන්නට එජාපය මැතිවරණවල දී සුළු පක්ෂයක් බවට පත්වනු ඇත. රනිල් වික්‍රමසිංහ මහතාට හා එජාප අනෙක් නායකයන්ට ඊනියා ලිබරල් මතවාදයක සිට සිංහල ජනතාවගේ සිතැඟි හඳුනාගැනීමට නොහැකි ය. එහි ප්‍රතිඵලය වනුයේ ඉහත කී ඡන්ද පදනම ක්‍රමයෙන් දියවී යෑම ය. වික්‍රමසිංහ මහතා දිවයින හා එහි කර්තෘ ජාතිවාදී යැයි කියන විට එජාපය ඒ ඡන්ද පදනම දියකරගනිමින් සිටියි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva